www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ බස් බෝම්බ දෙකකින් 20 කට අධික පිරිසක් මරා දැමෙති

## Two bus bombs kill more than 20 in Sri Lanka

**සරත් කුමාර විසිනි**
**2007 ජනවාරි 10**

පසු ගිය සිකුරාදා සහ සෙනසුරාදා ස්ථාන දෙකක සිදු වූ බස් බෝම්බ පිපිරීම්වලින් කාන්තාවන් සහ ළමුන් ද ඇතුලුව විසි ගනනක් ජනයා මරා දැමුනි.

ජනවාරි 5 දා සිදු වූ පලමු ප්‍රහාරය කොලඹින් කිලෝ මීටර 32ක් ඊසාන දිගට වන්නට පිහිටි නිට්ටඹුවේ දී සිදු වූ අතර එයින් 6 දෙනෙක් මරාදමා 50කට ආසන්න ගනනකට තුවාල සිදු කලේය. පිපිරීමෙන් ඉරී ගිය බස්රථය ගිනි ගත්තේ ය. තුවාල ලත් අයෙක් ද මිය යාම නිසා ඉරිදා වන විට මරන සංඛ්‍යාව 7 දක්වා ඉහල නැගුනි. එම පිපිරීමෙන් පැය 24 ක් ගතවීමටත් මත්තෙන් කොලඹ සිට දකුනු ප්‍රදේශය බලා ධාවනය වෙමින් තිබූ බස් රථයක් තුල හික්කඩුව නගරාසන්නයේ දී තවත් බෝම්බයක් පුපුරා ගියේ ය. එයින් 15ක් මරාදමා 40කට අධික පිරිසකට තුවාල සිදු කලේය.

මෙම ම්ලේච්ඡ ක්‍රියා සඳහා වහාම දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) වෙත වරද පැටවූ ආන්ඩුව, මිලිටරිය හා පොලීසිය දැඩි ආරක්ෂක පියවර පැනවූහ. පිපිරීමෙන් පසුව සෘජුව ම "සැකකරුවන්" 24ක් අල්ලා ගත් නිට්ටඹුව පොලීසිය ඉරිදා සිදු කල සෝදිසි මෙහෙයුමක දී තවත් 13ක් අත්අඩංගුවට ගත්තේ ය. අල්ලා ගත් අයගෙන් බොහෝ දෙනා දෙමල ජාතිකයෝ වෙති. බස්රථ හා මගීන් පරීක්ෂා කිරීමට සෝදිසිකරුවන්ගේ කන්ඩායම් බල ගන්වා ඇත.

පොලීසියේ අනුබලය ලත් මාධ්‍ය කටකතා මුලදී කියා සිටියේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් පිපිරීම්වලට හවුල්ව ඇති බවයි. නියෝජ්‍ය පොලිස්පති ජයන්ත ගමගේ ප්‍රකාශ කලේ දෙවන බෝම්බය පුපුරා යන විට කාන්තාවකගේ උකුලේ තිබී ඇතැයි විශ්වාස කරන බවයි. එවැනි කතා යොදා ගනු ලබන්නේ මාධ්‍ය සහ ආන්ඩුව විසින් කලඹන වාර්ගික හිස්ටීරියාවට තෙල් දැමීම සඳහා ය. මරාගෙන මැරෙන බෝම්බ වනාහි එල්ටීටීඊයේ සුපුරුදු සලකුනයි.

එසේ වුවත්, ඉන් පසුව ආන්ඩුවේ විශ්ලේෂකයෝ මරාගෙන මැරෙන බෝම්බ පිලිබඳ කතා ඉවත දමා ඇත. මුල් පිපිරීම සිදුව ඇත්තේ බස්රථයේ පසුපස ආසනය යට තබා තිබූ අධිබලැති කාලබෝම්බයක් පිපිරීමෙනි. පොලීසිය නිවේදනය කල පරිදි දෙවන පිපිරීමට හේතු වූ බෝම්බය තිබී ඇත්තේ බස්රථයේ ගමන් මලු තබන රාක්කයේ ය.

2002 දී ආන්ඩුව හා එල්ටීටීඊය අතර ඇති කර ගත් සම්පූර්නයෙන් ම අක්‍රීය සටන් විරාමය නිරීක්ෂනය කරන ශ්‍රී ලංකා නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්), ඉහල යන අනතුරට පත් සිවිල් වැසියන් පිලිබඳ "දැඩි කනස්සල්ල" පලකරමින් ප්‍රකාශ දෙකක් නිකුත් කල ද ප්‍රහාරවල වගකීම සෘජුව ම එල්ටීටීඊයට පැටවූයේ නැත.

බෝම්බ පිලිබඳ කිසිදු වගකීමක් භාරගැනීම එල්ටීටීඊ මිලිටරි ප්‍රකාශක රාසයියා ඉලන්තිරයන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීය. "මේ සිද්ධීන් සමග අපට සම්බන්ධයක් නැත. සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි වී ඇති නිසා ස්වභාවිකව ඕනෑ ම අයෙක් මේවා හෙලා දකිනු ඇත"යි ඔහු මාධ්‍ය වෙත කීවේ ය. එවැනි ප්‍රකාශන හුදෙක් මතුපිටින් ගත නොහැක. ශ්‍රී ලංකා ආන්ඩුවේ හා මිලිටරියේ අපරාධ සාමාන්‍ය වැඩ කරන ජනයා වෙත පටවා තම වාර්ගික ප්‍රහාර සාධාරනීකරනය කරමින් එල්ටීටීඊය මීට පෙර සිංහල හා මුස්ලිම් සිවිල් වැසියන් ඉලක්ක කොට ඇත.

2005 නොවැම්බර් මාසයේ බලයට පැමිනි තැන් පටන් ජනාධිපති මහින්ද රාජපක්ෂ එල්ටීටීඊය මත මිලිටරි ප්‍රහාර උත්සන්න කොට ඇත. පසු ගිය ජූලි මාසයේ දී 2002 සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කරමින් එල්ටීටීඊ පාලිත ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා ප්‍රහාරාත්මක ක්‍රියාන්විතයන්ට ඉදිරියට යාමට ඔහු අවසර දුනි. ශ්‍රී ලංකාන්ඩුව විවේචනය කරනු වෙනුවට එක්සත් ජනපදය හා අනෙකුත් මහ බලවතුන් කර ඇත්තේ සිවිල් වැසියන් බොහෝ ගනනක් ඝාතනය කල ගුවන් ප්‍රහාර ද ඇතුලත් නව ක්‍රියාන්විතයන්ට වක්‍රව සහයෝගය දීමයි.

ප්‍රතිප්‍රහාර එල්ල කිරීමක් ලෙස බස් බෝම්බ දෙක තැබීම එල්ටීටීඊය විසින් කලා වන්නට ඇත. මන්නාරම දිස්ත්‍රික්කයේ සිවිල් වැසියන් 16ක් ඝාතනය කරමින් ජනවාරි 2 දා සිදු වූ ගුවන් ප්‍රහාරයෙන් පසුව එල්ටීටීඊ ප්‍රකාශක සිවරත්නම් පුලිදේවන් "දරුනු විපාක" පිලිබඳව

අනතුරු හැඟවීය. එහෙත් වියහැකි එක ම චූදිතයා එල්ටීටීඊ ය නො වේ. කොළඹ යුද හිතවාදී හිස්ටීරියාවේ පරිසරයකට තවදුර තෙල් දැමීම සඳහා මිලිටරිය සහ එහි සහායක දෙමල පැරා මිලිටරි කන්ඩායම්වලට මෙවැනි ප්‍රකෝපකාරී ක්‍රියාවන් සිදු කිරීමේ හැකියාව ඉහලින් ම ඇත.

කවරෙකු වගකිව යුතු වුව ද මෙම ම්ලේච්ඡ ක්‍රියාවන් යොදා ගනු ලැබ ඇත්තේ වාර්ගික වෛරයන් ඇවිලවීමටත් එල්ටීටීඊයට එරෙහිව යලි ඇරඹූ යුද්ධය සාධාරනීකරනය කිරීමටත් සමස්තයක් ලෙස මහජනතාවට එරෙහි නව මර්ධනීය පියවරයන් හඳුන්වාදීමටත් ය.

නව ආරක්ෂක වැඩපිලිවෙලවල් පිලිබඳව සාකච්ඡා කිරීමට මිලිටරියේ හා පොලීසියේ ඉහල නිලධාරීන්ගේ රැස්වීමක් සෙනසුරාදා ජනාධිපති රාජපක්ෂ කැඳවීය. *ඩේලි මිරර්* පුවත් පත සඳහන් කරන ආකාරයට, රැ ස්වීම, එල්ටීටීඊයට එරෙහි මිලිටරි ක්‍රියාන්විතයන් දිගට ම කරගෙන යාමට තම කැපවීම ප්‍රකාශ කලේ ය. බස්රථ හා දුම්රියවල මගීන් හා ගමන් මලු දැඩිව සෝදිසි කිරීමට - ද්‍රවිඩ ජනතාවට එරෙහි හිරිහැර අනිවාර්යයෙන්ම තීව්‍ර කරනු ඇත්තා වූ පියවරකි - ආන්ඩුව නියෝග කොට ඇත.

එක්සත් ජනපදය බැග්ඩෑඩයේ පවත්වාගෙන යන කලාපයට සමාන අධිආරක්ෂිත කලාපයක් ස්ථාපිත කිරීම පිලිබඳව ආන්ඩුව සලකා බලමින් සිටන බව පසු ගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පුවත් පත සටහන් කලේ ය. "පැහැදිලිව පෙනෙන හේතුන් නිසා මෙම පියවරවල තොරතුරු ප්‍රකාශ කල නොහැකි වුවත් හරිත කලාපයක් (ග්‍රීන් සෝන්) - දැඩි ආරක්ෂක පියවරයන් යෙදෙනු ඇත්තා වු අධි ආරක්ෂිත කලාපයක් - නිර්මානය කිරීම දක්වා මෙම පියවර ඉදිරියට ඇදෙනු ඇති බව කිව හැක. කලාපය තුල මිනිසුන් මෙන් ම ඔවුන්ට අයත් හෝ පාවිච්චි කරනු ලබන වාහන තිරගත කිරීම හා ලියාපදිංචි කිරීම දක්වා එය ක්‍රියාවට නැගෙනු ඇත"යි පුවත් පත සඳහන් කලේ ය.

ආන්ඩුවට අයත් *ඩේලි නිව්ස්* පුවත්පතට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ කීවේ ආන්ඩුව සෝදිසි කන්ඩායම්වලට සමාන ඒවා ස්ථාපනය කරමින් යන බවයි. "දැනටමත් සෝදිසි කමිටු ගොඩනගා ඇති අතර ජනතාව වඩාත් සෝදිසියෙන් තැබීමට ඒවා යලි පනගැන්විය යුතු ය"යි ඔහු කිවේ ය. මෙම කන්ඩායම්වලට "තමන්ට සැක සිතෙන ඕනෑ ම පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමටත් ජනතාවට අනතුරු හැඟවීමටත් බලය ඇත."

එල්ටීටීඊයට එරෙහි පූර්න පරිමාන යුද්ධයක් සඳහා තමන් ගෙනයන ස්වෝත්තමවාදී උද්ඝෝෂනය තීව්‍ර කිරීමට ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) මෙම බෝම්බ පිපිරීම අවස්ථාවක් කර ගත්තේ ය. එල්ටීටීඊයට දිගටම ප්‍රහාර එල්ල කරන ලෙසත් ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා සමස්ථ ජාතිය ම බලමුලු ගන්වන ලෙසත් "දේශපාලන මන්ඩල ප්‍රකාශයක් ආන්ඩුවට බලකර සිටියේ ය. එම ප්‍රකාශය, එල්ටීටීඊය තහනම් කිරීම, 2002 සටන් විරාමය ඉරා දැමීම, සටන් විරාම නිරීක්ෂන කමිටුව ඉවත් කිරීම හා සාම මැදිහත්කරුගේ භූමිකාවෙන් නෝර්වේ ඉවත් කිරීම යන ජවිපෙ ඉල්ලීම් අවධාරනය කලේ ය.

උතුරේ හා නැගෙනහිරේ සිවිල් වැසියන්ට එරෙහිව මිලිටරිය ගෙන යන අවිචාරවත් ප්‍රහාරවලින් අවධානය ඉවතට හැරවීම සඳහා මෙම බෝම්බ පිපිරවීම් ආන්ඩුවට උපකාරී වී ඇත. නැගෙනහිර වාකරෙයි ප්‍රදේශයේ රෝහලකට එල්ල කල හමුදා කාල තුවක්කු ප්‍රහාරයකින් සඳුදා සිවිල් වැසියන් තිදෙනෙක් ඝාතනය කෙරුනි. මෙම මූලෝපායික ප්‍රදේශය අල්ලා ගැනීමත් එල්ටීටීඊයේ මිලිටරි හටකායන් විසුරුවා හැරීමත් ඉලක්ක කර ගත් දිග් ගැස්සුනු ප්‍රතිප්‍රහාරයක හමුදාව නිරත වී සිටී.

ජනාධිපති රාජපක්ෂ ප්‍රකාශයක් නිකුත් කරමින් බෝම්බ ප්‍රහාරවල වගකීම එල්ටීටීඊය මත පැටවූ අතර ම ඔවුන් වාර්ගික ප්‍රතික්‍රියාවක් අවුලුවාලීමට උත්සාහ දරන්නේ යයි කියමින් සංයමයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේ ය. "දෙමල ජනතාවගේ ගැටලුවලට සාමකාමී විසඳුමක් සඳහා රජය දරන උත්සාහයන්ට" බාධා කරන්නේ යයි ඔහු එල්ටීටීඊයට චෝදනා කලේ ය. සංයමය හා සාමය සඳහා රාජපක්ෂගේ නරුම ආයාචනා පසු ගිය වසර පුරා එල්ටීටීඊයට එරෙහිව මිලිටරිය මුදා හැරීමේ ඔහුගේ වාර්තාවට මුලුමනින්ම ප්‍රතිවිරුද්ධව පිහිටා සිටී.

යුද හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා පසු ගිය සතියේ ඍජුව ම කියා සිටියේ මිලිටරියේ සැබෑ අරමුන වන්නේ එල්ටීටීඊය නැගෙනහිරින් පලවා හැර ඉන්පසු උතුර අල්ලා ගැනීම සඳහා ප්‍රහාරයක් දියත් කිරීම බවයි. ජෙනරාල්වරයාට දෝෂාරෝපනය කරනවා වෙනුවට සඳුදා කතා කල ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල කියා සිටියේ ආන්ඩුව සාම සාකච්ඡාවලට සූදානමින් සිටින අතර ම කැරලිකරුවන් යටතේ පවතින ප්‍රදේශ නිදහස් කරගැනීමට දිගටම ක්‍රියා කරන බවයි. එවැනි තත්වයක් යටතේ සාමයක් ඇති විය හැකි දැයි විමසූ විට ඔහු කීවේ "සාමය ජනතාව සඳහා මිස එල්ටීටීඊය සඳහා නො වේ" යනුවෙනි.

වෙනත් වචනවලින් කිවහොත් එල්ටීටීඊය විනාශ කිරීම සඳහා තමන් ඇරඹූ යුද්ධය අවසන් කිරීමේ අභිප්‍රායක් ආන්ඩුවට නැති අතර තවත් බොහෝ සිවිල් වැසියන්ට ඒ සඳහා වන්දි ගෙවීමට සිදුවනු ඇත.

© www.wsws.org